# මනස, භෞතිකවාදය හා විඥානවාදය

වෙනස්වීම, මතකය, කාලය යන සංකල්ප එකිනෙක සමග බැඳී ඇත. වෙනස්වීමක් නැත්නම් කාලය යන සංකල්පයටවත්, මතකයකටවත් අවශ්‍යතාවක් පැන නො නගියි. එහෙත් වෙනස්වීම යන සංකල්පය ඇති වී තිබෙන්නේ ම වෙනස් නොවීමක් ගැන අප පළමුවෙන් සිතන බැවින් ය. අපට පළමුවෙන් ඇතිවන්නේ වෙනස් නොවන පුටුවක්, මේසයක්, පෑනක් වැනි දේ පිළිබඳ හෝ මම, ආත්මය වැනි වෙනස් නොවන ජීවයක් පිළිබඳ හැඟීමකි. මේ සියල්ල ආත්මවාදී වෙයි. පෑන පුටුව වැනි දෑහි නොවෙනස්වන යමක් පවතින්නේ යැයි ගැනීම ධර්මාත්මවාදී වෙයි. ජීවයක නොවෙනස්වන යමක් පවතින්නේ යැයි ගැනීම ජීවාත්මවාදී වෙයි. බොහෝ දෙනා ආත්මවාදී යන්නෙන් අදහස් කරන්නේ ජීවාත්මවාදී වීම ය. එහෙත් ධර්මාත්මයක් ඇතැයි සැලකීම ද ආත්මවාදී වෙයි. ඊනියා මනෝකායක් එසේත් නැත්නම් මරණින් මතු ගමන්කරන ශක්තියක් ගැන කතාකරන්නෝ නොදැනීම ආත්මවාදීහු වෙති. ශක්තියක් ගැන කතාකළ ද ආත්මයක් ගැන කතාකළ ද වෙනසක් නැත. එකක් ද්‍රව්‍ය වූ පමණින් හා අනෙක ජීවයක් හෝ ද්‍රව්‍ය නොවූ යමක් හෝ වූ පමණින් ආත්මවාදි අදහසෙහි වෙනසක් නො වෙයි.

වැඩිදුර යෑමට ප්‍රථම කිවයුතු කරුණක් වෙයි. බුදුදහමෙහි අනිත්‍ය යනු වෙනස්වීම නො වෙයි. එහි දී අනිත්‍ය යනු නිත්‍ය යන්නෙහි විරුද්ධාර්ථය ලෙස ගැනීම වැරදි ය. අනිත්‍ය යන්නෙන් නිත්‍ය යන්නෙනහි විරුද්ධාර්ථය නම් අප සියළු දෙනාට ම පාහේ අනිත්‍ය අවබෝධ වී ඇත. අපට නිත්‍ය යනු කුමක් දැයි වටහාගත හැකි ය. එබැවින් එහි විරුද්ධය ද වටහාගත හැකි ය. එහෙත් එසේ වටහාගත් පමණින් අපට නිවන් අවබෝධ නො වෙයි. එසේ නිවන් අවබෝධ නොවන්නේ ඇයි? එයට හේතුව වෙනත් තැන්වල දී  අනිත්‍ය යනු නිත්‍ය යන්නෙහි විරුද්ධය ලෙස ගතහැකි වුව ද, බුදුදහමෙහි අනිත්‍ය යනු සංකල්පයක් හෝ නොවීම ය. අනිත්‍ය දුක්ඛ අනාත්ම යනු සංකල්ප ලෙස ගැනීම ම වැරදි ය. ඒ සංකල්ප නම් අවසානයේ දී නිවන් අවබෝධවන්නේ ද සංකල්ප අවබෝධයකින් ය. එයටත් වඩා විහිළුවක් තවත් වෙයි ද? අනිත්‍ය දුක්ඛ අනාත්ම අවබෝධය (මෙහි දී අවබෝධය යනු සාමාන්‍ය ඥාණයකින් කෙරෙන අවබෝධයක් නො වෙයි. බුදු දහමෙහි මෙය විස්තර කෙරෙන්නේ ආසවක්ඛයා ඥාණය යනුවෙන් ය.) යනු තවත් සංකල්ප තුනක අවබෝධයක් පමණක් නම් ඕනෑම බුද්ධිමත් පවුකාරයකුට වුව ද නිවන් අවබෝධකිරීමේ හැකියාව වෙයි. නිවන් අවබෝධය සඳහා අනිත්‍ය අවබෝධ කරගත යුත්තේ සංකල්පයක් ලෙස නිත්‍ය යන්නෙහි විරුද්ධය ලෙස ගැනීමෙන් නො වෙයි.

අපට ප්‍රශ්නය වී ඇත්තේ ද අනිත්‍ය එලෙස සංකල්පයක් නොවන ආකාරයකින් අවබෝධකරගැනීම ය. අපට නිවන් අවබෝධය මෙතරම් දුෂ්කර වීමට එය ද එක් හේතුවක් වෙයි. අප අනිත්‍ය, අනාත්මය අවබෝධකරගන්නේ විරුද්ධාර්ථ ලෙස බුද්ධිවාදී ආකාරයකින් ය. එහෙත් කලින් සඳහන්කර ඇති ආකාරයට ඇතැම් භික්ෂූන් වහන්සේ ද බුද්ධිවාදී ආකරයකින් හෝ අනාත්මය අවබෝධකරගැනීමට අසමත්වෙති. උන්වහන්සේලා ආත්මය වෙනුවට ඊනියා ශක්තියක් ආදේශකිරීමෙන් නැවතත් ආත්මය පස්සාදොරින් රිංගවාගන්නේ එබැවින් ය.

අපි දැන් වෙනස්වීම යන සංකල්පය සළකමු. වෙනස්වීම යනු නොවෙනස්වීම යන්නෙහි විරුද්ධාර්ථයයි. නොවෙනස්වීම යන සංකල්පය අපට ඇතිවන්නේ ඇයි? නොවෙනස්වන ධර්මාත්මයක් (පුටුවක් වැනි දෙයක්) හෝ ජීවාත්මයක් හෝ ගැන අපට සිතෙන්නේ ඇයි? එයට හේතුව අප සියල්ල අවබෝධකරගන්නේ, දකින්නේ මනසින් වීම ය. මේ මනස තරම් භයානක දෙයක් තවත් නැත. මනස ගැන අප දන්නේ කුමක් ද? මනස ගැන අප දැනගන්නේ කෙසේ ද? පුටුව යන්න අප දැනගන්නේ මනසින් ය. පුටුව මේසය පමණක් නොව අනෙක් මිනිසුන් හා සතුන් ගැන ද අප දැනගන්නේ මනසින් ය. එහි ප්‍රශ්නයක් නැතැයි ගනිමු. ඒ පුටුව මේසය මෙන් ම අනෙක් මිනිසුන් හා සතුන් ද බාහිර වස්තු (පණ ඇති හෝ පණ නැති හෝ) වීම නිසා ය. එහෙත් අප අප ගැන ම දැනගන්නේ කෙසේ ද? අප අපේ මනස ගැන, වෙනත් අයකු ගැන නොව, අප ගැන ම දැනගන්නේ ද අපේ මනසින් ය. එයින් කියැවෙන්නේ යම් පුද්ගලයකු තම මනස ගැන දැනගන්නේ ද තම මනසින් බව ය. මනස පුටු මේස හා අනෙක් මනස් ගැන පමණක් නොව ඒ මනස ගැන ද දැනගනියි.

© Prof. Nalin De Silva

මනස භයානක යැයි කියන්නේ එබැවින් ය. මනස, වෙනත් මනසක් ගැන නොව ඒ මනස ගැන දැනගැනීමේ දී ස්වයංවිඥ්ඥාණයක්, තමන් තමන් ගැන ම දැනගැනීමක්, මමත්වයක්, මම හා මගේ ය පිළිබඳ හැඟීමක් ඇතිවෙයි. මෙහි තවත් පැත්තක් ද වෙයි. දැනුම යනු මනසේ නිර්මාණයක් යැයි අපි දිගින් දිගට ම කීවෙමු. පුටුව යන්න නිර්මාණය කෙරෙන්නේ මනස විසින් ය. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අනාවබෝධය හේතුකොටගෙන මනස විවිධ දැනුම් නිර්මාණය කරයි. (වැඩි විස්තර සඳහා මගේ ලෝකය කියවන්න) එසේ නම් මනස පිළිබඳ දැනුම නිර්මාණය කෙරෙන්නේ කුමක් විසින් ද? අප මෙහි දී කතාකරන්නේ වෙනත් මනස් ගැන නොව ඒ ඒ පුද්ගලයාගේ මනස ගැන ය. ඒ ඒ පුද්ගලයාගේ මනස නිර්මාණය කෙරෙන්නේ ඒ ඒ පුද්ගලයාගේ මනස විසිනි!

මනස පිළිබඳ ප්‍රශ්න රාශියකට ම මුළ මෙතැන ය. මනස තේරුම් ගැනීමට බටහිර විද්‍යාඥයන් අසමත්වන්නේ ද මේ හේතුවෙන් ය. බටහිර විද්‍යාඥයන් යම් දෙයක් ගැන අධ්‍යයනය කරන්නේ එයට පිටතින් සිට ය. නිව්ටෝනීය යාන්ත්‍රිකයේ සිට පරිණාමවාදය ඔස්සේ සාපේක්ෂතාවාදය දක්වා නිරීක්ෂකයා (observer) තමන් අධ්‍යයනය කරන පද්ධතියෙන් පිට සිටියි. පද්ධතියෙහි ගුණ නිරීක්ෂකයාගන් ස්වායත්ත වෙයි. නිරීක්ෂකයා ඇතත් නැතත් පද්ධතියට යම් ගුණයක් හෝ ගුණ හෝ වෙයි. නිරීක්ෂකයාගේ කාර්යය වනුයේ තමාගෙන් ස්වායත්ත වූ මේ ගුණ මැනගැනීම ය (දැනගැනීම ය). නිරීක්ෂකයා හා නිරීක්ෂ්‍යය එකිනෙකින් වෙන්කරන බැම්මක් විය. මේ බැම්ම බටහිර දර්ශනයෙහි හඳුන්වනු ලැබුයේ කාටීසීය තාප්පය (Cartesian wall) යනුවෙන් ය.  මේ තත්ත්වය තරමක් දුරට හෝ ප්‍රශ්න කරනු ලැබුයේ ක්වොන්ටම් භෞතිකය මගින් ය. එහි දී කාටීසීය තාප්පය කඩාදැමීමට නීල් බෝර් යන විද්‍යාඥයාට  සිදුවිය. නිරීක්ෂ්‍යය නිරීකයාගෙන් වෙන්කිරීමට නොහැකි බව ඔහු ක්වොන්ටම් භෞතික විද්‍යාව පිළිබඳ කරන ලද විවරණ මගින් පෙන්වා දුන්නේ ය. එහෙත් බටහිර විද්‍යාඥයන් ඒ බව පිළිගැනීමට මැළිකමක් දක්වන බව පෙනී ගොස් ඇත.

මනස පිළිබඳ කතාවේ දී මේ ප්‍රශ්නය ඉතා උග්‍ර වෙයි. මනස නිරීක්ෂණය කෙරෙන්නේ මනස විසින් ඇතුළතින් මිස පිටතින් නො වෙයි. අපි එතැනින් ද ඔබ්බට ගොස් මනස නිර්මාණය කෙරෙන්නේ ද මනස විසින් ම යැයි කියමු. අප විඥානවාදීන් හෝ භෞතිකවාදීන් හෝ නොවන්නේ ද එබැවින් ය. භෞතිකවාදීහු දළ වශයෙන් ගත්කළ මනසෙන් ස්වායත්ත වූ ලෝකයක් පවතින්නේ යැයි විශ්වාස කරති. ඔවුන්ට අනුව ලෝකය යථාර්ථයක් ලෙස පවතියි. ඔවුන්ගේ වෑයම මේ ලෝකය කුමක් දැයි දැනගැනීම ය. විඥානවාදීහු එසේ මනසින් ස්වායත්ත ව පවත්නා ලෝකයක් ගැන විශ්වාස නො කරති. විඥානවාදීන්ට අනුව, නැවතත් දළ වශයෙන් ගත්කල, ලෝකය නිර්මාණය කෙරෙන්නේ මනස විසින් ය. එනම් ලෝකයෙහි ගුණ මනස විසින් නිර්මාණය කෙරෙයි. පංචේන්ද්‍රිය ඔස්සේ මනසට ගෝචරවන දෑට මනස යම් යම් විවරණ ලබා දෙයි. එවැනි දෑ ඇතැයි මෙයින් ගම්‍ය නො වෙයි. ඒ දෑ ද මනසෙහි විවරණ නිසා ම නිර්මාණය වෙයි. එහෙත් විඥානවාදීන්ට අනුව මනසට ස්වාධීන වූ පැවැත්මක් ඇත. ඔවුන්ට අනුව මනස කිසිවක් විසින්වත් නිර්මාණය නොකෙරෙන්නක් වෙයි. අප කියා සිටින්නේ මනසට ද එවැනි ස්වාධීන පැවැත්මක් නොමැති බව ය. එසේ නම් මනස නිර්මාණය කෙරෙන්නේ කවුරුන් විසින් ද? එයට පිළිතුර මනස නිර්මාණය කෙරෙන්නේ මනස විසින් ම ය යන්න ය.

බොහෝ දෙනා මේ පිළිතුර භාරනොගන්නා බව පුදුමයක් නො වෙයි. එයට හේතුව අප බොහෝ දෙනා ඒක රේඛීය චින්තනයකට පුරුදු වී සිටීම ය. අපි යමකින් පටන්ගෙන වෙනත් දෑ කරා යන්නෙමු. අපට එක්කෝ මනසින් පටන්ගත හැකි ය. එසේත් නැත්නම් ලෝකයෙන් පටන්ගත හැකි ය. මනසින් පටන්ගන්නා ලෝකය දකින්නේ මනසෙහි නිර්මාණ ලෙස ය. ලෝකයෙන් පටන්ගන්නා මනස ද දකින්නේ ලෝකයෙන් ම, එනම් ලෝකයෙහි පවත්නා දැයින් නිර්මාණය වුවක් ලෙස ය. එහෙත් ඔවුහු කිසිවෙක් තමන් පටන්ගත් දෙය නිර්මාණය වූ බවක් නොකියති. ලෝක එනම් විශ්ව නිර්මාණය ගැන භෞතිකවාදීන්ට කීමට ඇත්තේ ඉතා ළාමක දෙයක් පමණකි. එය අද දවසේ නම් මහා පිපිරුම් ප්‍රවාදය ඔස්සේ ප්‍රකාශ වෙයි.

මහා පිපිරුම ද නිර්මාණයකි. එහෙත් හේතුවක් රහිත වූ නිර්මාණයකි. මහා පිපිරුම ඇතිවීමට හේතුව කුමක් දැයි දන්නා විශ්වවේදියෙක් නො වෙයි. එය ඉබේට ඇතිවූවක් වෙයි. ඉතාම දැඩි භෞතිකවාදියා වුව ද මෙහි දී අසරණ වෙයි. මහා පිපිරුමට පෙර වූයේ කුමක් ද, එසේත් නැත්නම් මහා පිපිරුම ඇති වූයේ කුමකින් ද (මුළු මහත් විශ්වය ම අබමල් රේණුවකට ද වඩා කුඩා පරිමාවක සංකේන්ද්‍රගතවූයේ කෙසේ ද ආදී ප්‍රශ්නවලට අමතර ව) වැනි ප්‍රශ්නවලට පිළිතුරු දිය හැක්කේ මහා පිපිරුමට පෙර කාලය යන සංකල්පය නොතිබූ බව කීමෙන් හා ඒ නිසා එයට පෙර, පෙර

© Prof. Nalin De Silva

යන සංකල්පය වලංගු නොවන බව පැවසීමෙන් පමණකි. අනෙක් අතට මනස නිර්මාණය වූයේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරු දෙන විඥානවාදියාට කළහැක්කේ මනස යනු පරම මනසක කොටසක් බව කීම හෝ මනස යනු එවැනි පරම මනසක නිර්මාණ බව කීම ය. මේ පරම මනස යනු අන් කිසිවක් නොව ලෝක නිර්මාපක දෙවියන් වහන්සේ ය. එහෙත් දැන් ප්‍රශ්නය වනුයේ දෙවියන් වහන්සේ නිර්මාණය කෙළේ කවුද යන්න ය.

ඒ ප්‍රශ්නයට හෝ මහා පිපිරුම නිර්මාණය වූයේ කෙසේ ද යන ප්‍රශ්නයට හෝ ඒක රේඛීය චින්තනයක පිළිතුරු නොමැත. එනම් ආරම්භය, ආරම්භවන්නේ කෙසේ ද යන්නට ඒකරේඛීය චින්තනයක පිළිතුරක් නොමැත. මෙවැනි ප්‍රශ්න චක්‍රීය චින්තනයක පැන නො නගියි. එයට හේතුව චක්‍රීය චින්තනයක ආරම්භයක් යනුවෙන් දෙයක් නො තිබීම ය. සිංහල බෞද්ධ චින්තනය චක්‍රීය වෙයි. ඒ චින්තනය මත පදනම් වූ අපි මනසෙහි නිර්මාණය සඳහා වෙනත් ම පිළිතුරක් දෙමු. ඒ පිළිතුර ඉහත සඳහන් පරිදි මනස මනසෙහි ම නිර්මාණයක් වේය යන්න ය. ඒ සමග අපි විඥානවාදයෙන් ද කැඩෙන්නෙමු. සිංහල බෞද්ධයනට භෞතිකවාදී හෝ විඥානවාදී හෝ නොවන දර්ශනයක් නිර්මාණය කරගත හැකි බව ඉන් පැහැදිලි වෙයි.

දැන් ප්‍රශ්න දෙකක් වෙයි. මනස මනසෙහි ම නිර්මාණයක් වන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරක් දිය යුතුවෙයි. අනෙක් අතට දෙවියන් වහන්සේ යනු දෙවියන් වහන්සේගේ ම නිර්මාණයක් වේය යනුවෙන් පිළිතුරක් දිය නොහැකි ද යන ප්‍රශ්නය මතුවෙයි. භෞතිකවාදී හෝ විඥානවාදී හෝ නොවන දර්ශනයක් මත පදනම් වෙමින් මේ ප්‍රශ්න දෙකට ම පිළිතුරුදිය හැකි වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva